සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 හා 02 ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන ආඛ්‍යාතය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

01 තරු පෙළ රාත්‍රී අහසේ රටා ........................................ (මවයි / මවති / මවනු ලබයි)

02 ගුරුවරු අපට හොඳින් ........................................ (උගන්වති / උගන්වයි / උගන්වන්නෙහු)

- 03, 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

03 (i) විමර්ෂණය (ii) සීඝ්‍රගාමී (iii) විශිෂ්ට (iv) කණගාටුව

04 (i) ප්‍රතිපලය (ii) කළමනාකරු (iii) ඛණිජ (iv) ගැහැණු

- 05 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05 'ක' වර්ගයට අයත් අකුරක් යෙදී ඇති වචනය තෝරන්න.

(i) ග්‍රන්ථය (ii) පුරාණ (iii) ලේඛනය (iv) පරිණාමය

06 පූර්ව ක්‍රියා පදය තෝරන්න.

(i) බලමින් (ii) ලීවේය (iii) නට නටා (iv) කියවා

07 උපසර්ගයක් ඇතුළත් වචනය වන්නේ,

(i) රටවල් (ii) අභිමානය (iii) තරුව (iv) අනතුරු

08 ''කළ වරද ගැන කනගාටු වීම'' වාක්‍යාංශය වෙනුවට යෙදිය හැකි තනි පදය

(i) පාපොච්චාරණය (ii) අනුස්මරණය (iii) පුරසාරම (iv) පසුතැවිල්ල

09 ක්‍රියා විශේෂණයට උදාහරණය වන්නේ,

(i) <u>මැටි</u> භාණ්ඩ බිඳෙන සුලු ය.

(ii) <u>දක්ෂ</u> දරුවා පන්තියේ පළමුවැනියා විය.

(iii) <u>සිල්වත්</u> භික්ෂුව දනට වඩියි.

(iv) කාලය <u>සෙමෙන්</u> ගෙවී යයි.

10 නිවැරදි පිළිතුර වන්නේ,

(i) ගැටය සහිත ඇලපිල්ලට පසුව මූර්ධජ 'ණ' කාරය යෙදෙයි.

(ii) රකාරාංශයට පසුව දන්තජ 'න' කාරය යෙදෙයි.

(iii) ගෞරවාර්ථ නාම පදවල මූර්ධජ 'ණ' යන්න නො යෙදෙයි.

(iv) ශ, ෂ අකුරු එක ළඟ යෙදෙන විට 'ෂ' යන්න මුලින් යෙදේ.

- අංක 11 හා 12 ප්‍රශ්නවල වාක්‍යය ව්‍යාකරණානුකූලව නිවැරදි කර ලියන්න.

11 ගුරුවරුන් දරුවෝ යහමග යවති.

..........................................................................................

12 ගොවියන් රට, සහලින් පෝෂණය කරයි.

..........................................................................................

13 මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

යහගුණ - ( අගුණ / දෙගුණ / අවගුණ / කෘතගුණ )

14 අභිකුණ්ඨික භාෂාවේ 'තාලේ' යනුවෙන් හඳුන්වන්නේ,

(i) පිහිය (ii) බේසම (iii) කුල්ල (iv) වංගෙඩිය

15 "දිය බිඳුවක ගැලී ගැලී" යන කවි පදයේ ඇතුළත් කාව්‍ය උපක්‍රමය වන්නේ,

(i) රූපක (ii) උපමාව (iii) විරිත (iv) අනුප්‍රාසය

16 ලෝකෝපකාරය ලියන ලද්දේ,

(i) අලගියවන්න මුකවෙටි තුමා (ii) වැත්තෑවේ හිමි

(iii) රණස්ගල්ලේ හිමි (iv) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

17 දී ඇති කවිය සම්පූර්ණ කර ලියන්න.

උදව්වක් වශයෙන් කිසිවක් නො කළ කෙනෙකුට

..........................................................................................

18 ' තොප්පි ! තොප්පි ! තොප්පි ' මෙම කොටස ඇතුළත් නාට්‍යය පිටපත ලියන ලද්දේ,

(i) ජයලත් මනෝරත්න (ii) එදිරිවීර සරච්චන්ද්‍ර

(iii) සෝමලතා සුබසිංහ (iv) හෙන්රි ජයසේන

19 දී ඇති පදවලට තනි පද ලියන්න.

(i) කළ ගුණ නොදත් ..........................................

(ii) සමාන නොවන ..........................................

20 වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(i) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කරයි.

..........................................................................................

(ii) ඇහැළ ගස් මල්වලින් බරවී තිබේ.

..........................................................................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළත්ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01 (i) සිට (v) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර කීයද? ඒවා ලියා දක්වන්න.

(ii) ආරාධනා පත්‍ර සැකසීමේදී අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු ලක්ෂණ 3 ක් ලියා දක්වන්න.

(iii) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් ලියන ලද ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ 2 ක නම් ලියන්න.

(iv) සමනොළ කන්ද තරණය කරන සැදැහැවත් ව්‍යවහාර කරන විශේෂ වචනවල පොදු ව්‍යවහාරය කුමක්දැයි ලියා දක්වන්න.

(අ) කෝඩුකාරයා -

(ආ) සැහැල්ලුව -

(v) පහත ක්‍රියා පද නම් කර ඒවා යොදා කෙටි වාක්‍ය බැගින් ලියන්න.

(අ) නටමින් -

(ආ) ගොස් - (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.

(i) වන ජීවීන් රැක ගනිමු.

(ii) අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මං සලසයි.

(iii) මා දුටු සීගිරිය

(iv) කියවීමේ අගය (ලකුණු 20 යි.)

03 ඔබේ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වීමට නියමිත ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගි වන ලෙස ආරාධිතයන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණාත්මකව සකස් කරන්න.

(ලකුණු 10 යි.)

04 පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නැගෙනහිර චීනයේ කහ මුහුදු බොක්කේ සිට මොන්ගෝලියාවේ බටහිර සීමාව දක්වා විහිදී ඇති චීන මහා ප්‍රාකාරය මිනිස් දෑතින් ඉදිවූ විස්මය දනවන දැවැන්ත නිර්මාණයකි. මෙහි ඉදිකිරීම් ක්‍රි.පූ. 6 වන සියවසේදී පමණ ආරම්භ වී ඇති අතර ක්‍රි.ව. 16 වන සියවස දක්වා ම එහි ඉදිකිරීම් ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ කටයුතු සිදුවී ඇත. චීන අධිරාජ්‍යයේ උතුරු සීමාවට නිරන්තරයෙන් එල්ල වූ මොංගෝලියන් (හන) ආක්‍රමණවලින් ආරක්ෂා වීම සඳහා මේ මහා ප්‍රාකාරය ඉදිකර ඇතැයි සැලකේ. නැගෙනහිරින් ෂැන්හයිගුවාන් සිට බටහිරින් ලොප් නූර් දක්වා විහිදී ඇති ප්‍රාකාරයේ දිග කි.මී. 6400 ක් පමණ වේ.

(i) මෙම ඡේදය සඳහා සුදුසු මාතෘකාවක් ලියන්න.

(ii) ප්‍රාකාරය විහිදී ඇති සීමාව කුමක් ද?

(iii) ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ කටයුතු සිදුව ඇති කාලසීමාව දක්වන්න.

(iv) මෙය ඉදිකරන්නට ඇත්තේ කුමන හේතුවක් නිසාද?

(v) මෙම වචනවල තේරුම ලියන්න.

(අ) ප්‍රතිසංස්කරණය -

(ආ) ප්‍රාකාරය - (ලකුණු 2 x 5 = 10)

05 පහත වාක්‍යය නිවැරදි කර ලියන්න.

(i) නුඹලා ග්‍රහලෝකාගාරය බැලීමට ගියෙහි.

(ii) නගරාධිපතිතුමා පුස්තකාලය විවෘත කළහ.

(iii) අපි කම්කරුවෝ වැඩ කරන තැනට ගියෙමු.

(iv) තාරකා දීප්තිමත්ව බබළති.

(v) නා හිමියන් දහම් දෙසති. (ලකුණු 2 x 5 = 10)

06 පහත උද්ධෘත ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

(i) කීයද මේ තොප්පි ? ගණන්ද මේ තොප්පි ?

(ii) කවුද, ඇට බය ? ගැහැනියකට බයේ කෑම නො කා පලා යනවා'යැ ?

(iii) අපි ගිහින් එන්නම් රාලහාමි, තව ටිකකින් 'කළු ගඟුල' එවන්නම්.

(iv) "ඇයි මැණියනි, මම කුමන අන්‍යායක් කෙළෙම් ද?"

(v) උපාසක මහත්තයෝ, අද බෝධි පූජාවේ ප්‍රධාන දායක තැන කවුද? (ලකුණු 2 x 5 = 10)

| | පාඩමේ නම | කා විසින් කියන ලද්දක් ද? | කීවේ කාහට ද? |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |